**තලාව ප්‍රාදේශීය සභාව - 2020**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

තලාව ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට තලාව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**--------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**---------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 2019/02 දරණ චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ක්‍රමයට අනුව ඉදිරිපත් කර ඇති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂය සමඟ සැසඳිය නොහැක.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.6 ඡේදයේ 1.6.2 සහ 1.6.3 නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

----------------------------------------------------------------------

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් ලේඛන ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් ශේෂය රු.17,249,886 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.17,220,735 ක් ලෙස රු.29,151 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදි හිඟ වරිපනම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කළයුතු වේ. |
| (ආ) | ලෙජරය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අතිරික්තය රු.469,081,516 ක් වුවත් වත්කම් හා වගකීම් ප්‍රකාශයේ එය රු.540,548,759 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා හිමිකම් ශේෂය රු.71,467,243 කින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | නිවැරදි හිමිකම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කළයුතු වේ. |
| (ඇ) | වත්කම් වර්ග 08 කට අදාළව හඳුනාගත් ප්‍රත්‍යාගණන අගයට වඩා රු.71,467,244 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා සමුච්චිත අරමුදලේ වටිනාකම එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි වත්කම් ප්‍රත්‍යාගණන වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කළයුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීමට වර්ෂය ආරම්භයේ මුදල් ශේෂය එකතු කළවිට මුදල් ශේෂය රු.27,830,827 ක් වුවත් ශේෂ පත්‍රයේ මුදල් හා මුදල් සමාන දෑ ශේෂය රු.13,150,483 ක් ලෙස රු.14,680,344 කින් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් මාර්ග, පාලම් සහ බෝක්කු ඉදිකිරීම් හෝ වෙනත් ආයතන වලින් ඉදිකර පැවරීම් සිදුකිරීම හෝ නොතිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී මාර්ග, පාලම් සහ බෝක්කු ඉදිකිරීම් ලෙස රු.112,003,925 ක් ගිණුම්ගත කිරීම නිසා සභාවේ ජංගම නොවන වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ජංගම නොවන වත්කම් ලෙස හඳුනාගත් ඉදිකිරීම් පමණක් ගිණුම්ගත කළයුතු වේ. |
| (ඊ) | ශේෂ සනාථ කිරීම් ලිපි අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.2,016,957 ක විශ්‍රාම වැටුප් ශේෂය, ගෙවිය යුතු ශේෂයක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම නිසා සභාවේ ජංගම වගකීම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 මූල්‍ය ප්‍රකාශන වලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගෙවිය යුතු වියදම් ජංගම වගකීම් ලෙස ගිණුම්ගත කළයුතු වේ. |
| (උ) | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) මගින් සිදුකරනු ලබන ව්‍යාපෘතියක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී අදාළ කොන්ත්‍රාත්කරුට ගෙවූ රු.1,863,030 ක වැඩ ආරම්භක අත්තිකාරම්, අළුත්වැඩියා වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් එම වටිනාකමින් වැඩිවී තිබුණු අතර ජංගම වත්කම් එම වටිනාකමෙන් අඩුවී තිබුණි. | පිළිගනිමි. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවීම් ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කළයුතු වේ. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු, වියදම ඇස්තමේන්තු කර ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. | ගෙවිය යුතු ගාස්තු ඇස්තමේන්තු පදනම මත හෝ ගිණුම්ගත කළයුතු වේ. |
| (එ) | සේවක ණය ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂය රු.7,741,395 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.6,565,608 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ජංගම වත්කම් රු.1,175,787 කින් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. | නිවැරදි ණය ශේෂ වටිනාකම ගිණුම්ගත කළයුතු වේ. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 06 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.1,243,565 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිගනිමි. | උපලේඛන වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම්වලට අනුරූප විය යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු.8,533,622 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි. | සනාථ කිරීම් ඉදිරිපත් කළයුතු වේ. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | උතුරු මැද පළාත් ආණ්ඩුකාරවරයාගේ 2018 අගෝස්තු 29 දිනැති 2086/15 දරන ගැසට් නිවේදනය 5 ඡේදය | 2019 ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර් මාස වලදී සභාපතිවරයාට දිනකට රු.700 බැගින් දින 17 ක් සඳහා සංයුක්ත දීමනා ගෙවීම නිසා රු.11,900 ක අධිගෙවීමක් සිදුවී තිබුණි. | පරීක්ෂාකර බලා ඉදිරියේදී අයකිරීමට කටයුතු කරමි. | අධිගෙවීම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xiv පරිච්ඡේදයේ 4.1 වගන්තිය | ගමන් කළ දුර මීටර් 750 ක් සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු දෙදෙනෙකු වෙත 2018 ජනවාරි සිට 2020 සැප්තැම්බර් දක්වා කාලය වෙනුවෙන් සංයුක්ත දීමනා සහ ගමන් වියදම් ලෙස රු.170,407 ක් ගෙවා තිබුණි. | සොයාබලා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | ආයතන සංග්‍රහය ප්‍රකාරව ක්‍රියාකළ යුතුවේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.57,052,501 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.22,570,537 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු**<br>2020 දෙසැම්බර් 31 දිනට රු.17,220,735 ක් වු හිඟ වරිපනම් බදු අයකර නොතිබුණි. | පිළිගනිමි. | ඇස්තමේන්තුගත ආදායම් රැස්කර ගැනීමට ක්‍රියාකළ යුතුවේ. |
| **(ආ) කුලී**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.917,097 ක් වු කුලී අයවී නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| **(ඇ) බලපත්‍ර ගාස්තු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.174,500 ක් වු බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කරමි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යන් ඉටුකිරීම පිළිබඳව වු නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

**3.1 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.6,390,000 ක් වූ සභාවට අයත් කැබ්රථයක් 2019 අප්‍රේල් 15 දින අනතුරකට භාජනයවීම නිසා රු.3,400,520 ක අලාභයක් සිදුවී තිබුණද එම අනතුර සම්බන්ධ තොරතුරුවල සාවද්‍ය තත්ත්වය සහ අවභාවිතයන් පදනම්ව රක්ෂණ වන්දි ප්‍රතික්ෂේප වී තිබුණු බැවින් දේශීය නියෝජිතයාගේ ප්‍රාදේශීය අළුත්වැඩියා මධ්‍යස්ථානයක රඳවා තිබුණි. | මේ සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂණයේ වාර්තාව අනුව කටයුතු කිරීමට අවධානය යොමුකර ඇත. | අලාභය අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේදී රු.1,040,735 ක අවම ලංසුවකට බදු දුන් වෙළඳ ස්ථාන 04 ක් උපරිම ලංසුවට බදුනොදී සමාලෝචිත වර්ෂයේදීද රු.924,078 ක අවම ලංසුවකට බදුදී තිබුණි. | පිළිගනිමි. | ලබාගත හැකි උපරිම බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | කරගහවැව කසළ අංගනය ඉදිකිරීම සඳහා 2012 සිට 2017 දක්වා වූ වර්ෂවලදී මධ්‍යම පරිසර අධිකාරියෙන් සභාවට රු.3,446,848 ක් ලැබී තිබුණු අතර ඉන් රු.1,121,026 ක මුදලක් වියදම් කර තිබුණි. එහෙත් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ ඉදිකිරීම් අවසන් නොකිරීම නිසා එම කසළ මධ්‍යස්ථානයෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නොහැකිවී තිබුණි. | ඕරුගලයාය කසළ අංගනය ස්ථිරවම සභාවේ කසළ බැහැර කිරීම සඳහා යොදාගනු ලැබේ. | කරගහවැව කසළ අංගනය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ඇ) | 2018 වර්ෂයේදී සභාව විසින් නිකුත් කරන ලද ලදුපත් 65 කට අදාළව ලැබී තිබුණු රු.371,946 ක් සහා අරමුදලට බැර කර නොතිබීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන්ගෙන් එම මුදල් අයකර ගෙන නොතිබුණි. | පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතී. | පරීක්ෂණ කටයුතු කඩිනමින් නිමකර මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |